**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)

Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com

AIALIFE.COM.LK

# Media Release

## ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත AIA ඉන්ෂුවරන්ස්හි රැකවරණය හිමි වේ

**2015 මාර්තු මස 16 වැනි දින කොළඹදී ඃ** ශ්‍රී ලංකාව එකම ජාතියක් වශයෙන් එක්ව බැඳෙන්නා වූ යමක් පවතී නම් ඒ ක්‍රිකට් ක්‍රීඩාවයි. එය දිවයිනේ සියළු දෙනා එක්ව නරඹන සෑම දෙනාම අගය කරන්නාවූ කණ්ඩායම් ක්‍රීඩාවකි. ශ්‍රී ලංකා ක්‍රිකට් යනු නිසැකවම අපගේ අනර්ඝතම ජාතික වත්කම් වලින් එකකි.

ජාතියට අභිමානයක් වූ අපගේ ක්‍රිකට් කණ්ඩායම සුරැකීමේ අරමුණින් යුතුව AIA ඉන්ෂුවරන්ස් ඓතිහාසික වූ සහයෝගීතාවයකට එළඹියේ ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිල රක්ෂණ සහකරු වශයෙනි. මෙම සහයෝගීතාවය යටතේ AIA ඉන්ෂුවරන්ස් වසර තුනක කාල සීමාවක් සඳහා ප්‍රිමියර් සීමිත ඕවර තරඟාවලියෙහි සහ ප්‍රිමියර් ලීග් තරඟාවලියෙහි නිල ලාංඡන අනුග්‍රාහකයා බවට පත් වේ. මෙම සහයෝගීතාවය AIA ඉන්ෂුවරන්ස් සහ ශ්‍රී ලංකා ක්‍රිකට් යන දෙපාර්ශවයටම සුවිශේෂී එකඟතාවයකි.

''ක්‍රිකට් ක්‍රීඩාව වෙත අප හදවතේ සුවිශේෂී ස්ථානයක් හිමි වන අතර සැබෑ ජීවිතය හඳුනන රක්ෂණ සමාගමක් වශයෙන් අප මෙම සහයෝගීතාවය වෙත එළැඹියේ සියළු ශ්‍රී ලාංකිකයින් හට අතිශය වැදගත් වන අපගේ ක්‍රිකට් ශූරයින් වෙත රැකවරණය සැලසීමේ අරමුණින් බව පැවසිය යුතුයි.'' යනුවෙන් AIA ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකාහි ප්‍රධාන විධායක නිලධාරී ෂා රූෆ් පැවසීය. ''එමෙන්ම මෙය අපගේ මෙහෙයුම් චාරිකාවේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන අතර මෙමගින් ශ්‍රී ලාංකික ජන හදවත් තුළ නොමැකෙන සිහිවටනයක් ජනිත කිරීම අපගේ අපේක්ෂාවයි” යනුවෙන් හෙතෙම තවදුරටත් ප්‍රකාශ කලේය.

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නායක ඇන්ජලෝ මැතිව්ස් මේ සම්බන්ධයෙන් මෙසේ සිය අදහස් දැක්වීය. ''ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ අප සියළු දෙනා, AIA ඉන්ෂුවරන්ස් අපගේ නිල රක්ෂණ සමාගම ලෙස ඉමහත් සතුටින් පිළිගන්න අතර ඔවුන් සමග අනාගතයේ දී සවිමත් සබඳතාවයක් ගොඩනගා ගැනීමට අපේක්ෂා කරනවා.''

**Media Enquiries: Suren Perera, Head of Marketing & Company Spokesman Office 2310028, Mobile – 0773 457 959**